# 2018 ජුනි මස සාංඝික පවුල් දින සුපුවත

01. ආරම්භක ගීය - පුබුදු ගී අංක 11

"සුදතුම් මගුලයි සුරිඳුන් බලයයි අප හද පුබුදුන්නේ...."

ප්‍රශංසාවට හැඳින්වීම : පසුගිය දා අපගේ වාර්ෂික මංගල මහෝත්සවය එනම්, ශුද්ධාත්ම ආගමන මංගල මහෝත්සවය ඉතා ගාම්භිර අන්දමින් පැවැත්වූයෙමු. "ඔබ වහන්සේගේ වචනය ද, කැමැත්ත ද, ගින්නකි ආශිර්වාදයකි" යනුවෙන් ඉදිරි වසර පුරා අප ජීවිතවල පරම අත්දැකීම කර ගන්නට එම මහා අනාවරණය අප වෙත දානය කළාවූ, අපට ඒ සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේ ගේ විශේෂ ස්නාපනයක් එම ශුද්ධවූ රාත්‍රිය තුළ දානය කළාවූ මහෝත්තම අබ්බා පියාණන් වහන්සේට අපගේ ස්තුතිය, ප්‍රශංසාව, වන්දනාව, නමස්කාරය පුද කරමු.

ගීය : 2018 ශුද්ධාත්ම මංගල තේමා ගීය (ඔබ සාංඝිකයට ලබාගත් හඬපට / CD තැටි උදව් කර ගන්න.)

02. දවසේ සුපුවත :

* " ඔබ වහන්සේගේ වචනය ද, කැමැත්ත ද, ගින්නකි; ආශිර්වාදයකි" ( ශු. ලූක් 12:49 හා ශු. ලූක් 11:28 ඇසුරෙන්) මේ වසර වෙනුවෙන් අපට ලැබුණ මහා අනාවරණය වන මෙම වාර්ෂික තේමාව තුළ ශුද්ධවූ ත්‍රිත්වයම ප්‍රකාශ වෙනවා.

**<u>ඔබවහන්සේගේ</u>** - කියන්නේ දේව තාත්තාගේ; දෙවියන් වහන්සේගේ; අබ්බා තාත්තාගේ

**<u>වචනය ද</u>** - කියන්නේ වචනයාණෝ; වාක්‍යාණෝ; ධර්මයාණෝ (ශු. ජොහාන් 1:1); ක්‍රිස්තුන් වහන්සේ

**<u>කැමැත්ත ද</u>** - මේ වචනයාණන්ට, ක්‍රිසතුන් වහන්සේට, අරමුණක් තිබුණා. මොකක්ද ඒ අරමුණ?

**ශු. ජොහාන් 5:30** "මාගේ අරමුණ, මාගේම කැමැත්ත ඉටු කිරීම නොව, මා එවා වදාළ ඔවුන් වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමය. " අපි අපේ හදවත්වලත් මේ වචනය කොටා ගන්න ඕන ඇයි? එය අපගේද ජීවිත අරමුණ විය යුතු නොවන්නේද? "ඔවුන් වහන්සේගේ වචනය ගින්නක්; ඔවුන් වහන්සේගේ වචනය ආශිර්වාදයක් "

**හිතෝපදේශය 29:18** ප්‍රකාශ කරනවා, 'අරමුණක් නැති මිනිසා හිතුවක්කතාරයෙක් කියලා. ක්‍රිස්තුන් වහන්සේට අරමුණක් තිබුණා. ඒ අරමුණ තමා තාත්තාගේ කැමැත්ත ඉටු කිරීම. ඒ අරමුණෙන් පිට ඔවුන් වහන්සේ ගියේ නැහැ. දෙවියන් වහන්සේගේ වචනයයි, දෙවියන් වහන්සේගේ කැමැත්තයි හරියට එකට ගෙතිලා තියනවා මාලයක මුතු ඇට දෙකක් වගේ එකිනෙකට ගොඩක් ළංවෙලා යනවා. එකිනෙකට ගොඩක් සම්බන්ධයි.

**ගින්නකි** - ගින්න ශුද්ධාත්මයාණන් වහන්සේයි. මේ තේමාව රැගෙන තිබෙන්නේ ශු. ලූක් 12:49 සහ ශු. ලූක් 11:28 ඇසුරෙන්)

ශු.ලූක් 12:49-50 (පොදුවේ ප්‍රකාශ කිරීම හා කුඩා කණ්ඩායම් තුළ සාකච්ඡා කරන්නට යොමු කරන්න.)

12:49 - " පොළොව මත ගිනි ලන්න ආවෙමි. ගින්න දැනටම ඇවිළී තිබේ නම් කොපමණ හොඳද" ශුද්ධාත්මයාණන් තුළ දෙවියන් වහන්සේගේ වචනය දෙස බලද්දී මොකක්ද මේ ගින්න.

12:50 - " මට එක්තරා බව්තීස්ම ස්නාපනයක් ලබන්න තිබේ; එය ඉටුවන තුරු මම දැඩි සිත් වේදනාවෙන් පසු වෙමි. "

මෙසේ ප්‍රකාශ කරන්නේ ඔවුන් වහන්සේගේ දුක්විඳීම, කුරුසියේ මරණය හා උත්ථානය ගැනයි. ඒ තුළිනුයි ශුද්ධාත්මයාණන් වහන්සේව අපට තෑගි කළේ. ශුද්ධාත්මයාණන් වහන්සේ ගින්නක්. මේ ගින්නට හසුවුණු කෙනෙකුට නිකන් ඉන්න බැහැ. අපි දැක්ක (ප්‍රශංසා එකතු සුපුවත තුළ) මේ ගින්නට හසුවුණ ස්වාමි තාත්තා ගේ අත්දැකීම ගැන. පියතුමෙක් හැටියට සිටින විට, මුහුණදුන් සිද්ධියක් නිසා කලකිරිලා, කනස්සල්ලට පත් වෙලා හිටියා. මේ ශුද්ධාත්ම ගින්නට හසු වෙලා, මේ එක 'මිනිසා' මේ දේශය තුළ අපි ඔක්කෝමවම ඇවිළුවා. අපි ශුද්ධාත්මයාණන් වහන්සේගේ ගින්නට හසුවෙලා. ඔවුන් වහන්සේගේ ගින්නෙන් අපි ඇවිලෙනවා. පොළොව මත ගිනිලන්න මම ආවෙමි. ගින්නෙන් මොනවද වෙන්නේ ? ගින්න මිනිසාව අලුත් කරනවා. මිනිසාගේ පාපය, ආත්මාර්ථය, වහල්බැම් පුළුස්සා දමා අප තුළ අලුත් කෙනෙක්ව මවන්නට ගින්නට, මේ ශුද්ධාත්මයාණන් වහන්සේට බලය තියනවා.

ආශිර්වාදයකි - මේ වසරේ මෙම තේමාව අපේ ජීවිතවලට ළංකර ගන්නට නම්, අපි ක්‍රිස්තුස් වහන්සේ දෙස වැඩි වැඩියෙන් බලන්න ඕන. ක්‍රිස්තුන් වහන්සේ මනුෂ්‍ය පුත්‍රයා හැටියට කොහොමද දෙවියන් වහන්සේගේ වචනයට ආදරය කළේ? දෙවියන් වහන්සේගේ කැමැත්ත කොහොමද කළේ කියන එක දිහා අපි බලන්න බලන්න, අපේ පුත්‍රභාවය තුළත් අපටත් දෙවියන් වහන්සේගේ වචනයට පිපාස වෙන්නටත් දෙවියන් වහනසේගේ කැමැත්ත නිරන්තරයෙන් අපි හොයලා, දේව කැමැත්තට අවනත වෙන්න අපට ශුද්ධාත්මයාණන් වහන්සේ ශක්තිය දෙන්නට පටන් ගන්නවා. එතකොට තමයි අපට ආශිර්වාදය ලැබෙන්නේ. ආශිර්වාදය කියන්නේ දෙවියන් වහන්සේගේ වචනයට කීකරු වෙන අයට, ඔවුන් වහනසේගේ කැමැත්ත කරද්දී තමයි දෙවියන් වහන්සේගේ ආශිර්වාදය අපට අත්දකින්න පුලුවන්. ඒක ලෝක ආශිර්වාදය වගේ නෙමේ.

**ක්‍රිස්තුන් වහන්සේ දෙස අපේ නෙත සිත හදවත යොමු කරමු**

ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයට මේ වචන සවල්පය (තේමාව) කොහොමද ඖෂධයක් වුනේ? ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයේ සුවිශේෂතම සිද්ධීන් දෙකකට අපි අවධානය යොමු කරමු. ඔවුන් වහන්සේගේ ජීවිතයේ ප්‍රධානතම සිද්ධීන් දෙකක් හැටියට අපට බලන්න පුලුවන් අපගේ තේමාවත් එක්ක :

1. ජේසුගේ ජීවිතයේ ප්‍රබලතම සිද්ධිය තමයි කුරුසියේ මරණය.

2.මේ කුරුසියේ මරණයේ ආරම්භක සිද්ධිය තමයි ජොර්දාන් නදියේ බෞතිස්ම ස්නාපනය.

මේ ප්‍රධාන සිද්ධීන් දෙකට අපේ අවධානය යොමු කරමු.

1. ජොර්දාන් නදියේ බව්තිස්ම ස්නාපනය :

කිසිදු පාපයක් නොදත් ජේසුස් වහන්සේ ජොර්දාන් නදියේ ස්නාවක ජුවාම් තුමා වෙතින් බව්තීස්ම ස්නාපනය ලබන්නට පව් කාරයෙකු ලෙස පෝලිමේ එනවා. ඒ කාලයේ බෞතිස්ම ස්නාපනයෙදී විශේෂ ලක්‍ෂණ කිහිපයක් තිබුණා. එකක් තමයි පාපොච්චාරණය. ඉන් පස්සේ ඒගොල්ලෝ ජොර්දාන් නදියේ ගිලිලා එද්දී ඒගොල්ලන් බලාපොරොත්තු වුනා ඒගොල්ලන්ගේ පරාජිත ජීවිතය නැති වෙලා, අළුත්ම අළුත් ජීවිතයක් ලබා ගැනීම.

දැන් අපට එක පාරටම ඇතුලාන්තයෙන් ප්‍රශ්නයක් ඇතිවෙනවා ඇති ජේසුට පුළුවන්ද පාපොච්චාරණය කරන්න? ජේසු පව් කරලා නැහැනේ. පව් මොනවද කියලා ජේසු දන්නෙත් නැහැ, දැන් ජේසුට අළුත් ජීවිතයක් ආරම්භ කරන්න පුලුවන්ද?

දැන් බලන්න අපට ඇති වුනු මේ ප්‍රශ්නයම ස්නාවක ජුවාම් තුමාටත් ඇති වෙනවා. ස්නාවක ජුවාම් තුමා ජේසුගෙන් පුදුම ප්‍රශ්නයක් අහනවා; "ඔබෙන් බෞතිස්ම ස්නාපනය ලැබිය යුත්තේ මමය" එහෙත් ඔබ මා වෙත එන සේක්ද?" (ශු. මතෙව් 3:14) දැන් ස්නාවක ජුවාම් තුමා මේ මිනිසුන්ට බෞතිස්ම ස්නාපනය දීලා කෑ මොර ගහලා පාපයෙන් හැරෙන්න කියලා කියන්නේ ජේසුට මාර්ගය හදන්නයි. දැන් මේ මෙසියස් කොහොමද මගෙන් බෞතිස්ම ස්නානය ලබන්නේ කියන ප්‍රශ්නය ස්නාවක ජුවාම් තුමාට ආවා. දැන් ජේසු ස්නාවක ජුවාම් තුමාට පුදුම පිළිතුරක් දෙනවා.

ශු. මතෙව් 3:15 "දැනට ඉඩ දෙන්න; මෙසේ දේව කැමැත්ත මුළුමනින් ඉටු කිරීම අපට සුදුසුය." මේ වචනයත් අපේ හදවතේ කොටා ගන්න ඕනේ. කවදාවත් මේ වසරේදී මේ වචනය අමතක වෙන්න බැහැ.

ඔවුන්වහන්සේ අවසානය දක්වාම දේව කැමැත්තට ආමෙන්! කියනවා. 'ඔබවහන්සේගේ කැමැත්තට වහලෙක් වෙන්නම්'දේව අම්මා වාගේ. පාපයක් නොදත් ජේසුස් වහන්සේ හට පාපයේ පීඩාවන්ට මුහුණ දෙන්නට සිදුවෙනවා. ජේසු මුළු මිනිස් සංහතියේම, සදාකාලයටම ජීවත් වෙන මනුෂ්‍යයින්ගේ පාපය ඔවුන්වහන්සේගේ උරහිස මතට ගන්නවා.

2. **ක්‍රිස්තුන් වහන්සේගේ දුඃඛ ප්‍රාප්තිය හා කුරුසිය මත මරණය :**

ඔවුන්වහන්සේගේ බව්තීස්ම ස්නාපනය කියන්නේ මානව සංහතිය උදෙසාම ජේසු මරණය භාරගන්නවා.

ශු. මාක් 10:38,39 එහෙත් ජේසුස් වහන්සේ, "ඔබ ඉල්ලන්නේ කුමක් දැයි ඔබම නොදන්නහුය. මා බොන දුක් වේදනා නමැති කුසලානෙන් බොන්න හෝ මා ලබන බව්තීස්ම ස්නාපනය ලබන්නට හෝ ඔබට හැකි දැ"යි ඔවුන්ගෙන් ඇසූ සේක.

ඔවුන්වහන්සේ පාත්‍රයක් ගැන, බව්තිස්ම ස්නාපනයක් ගැන කතා කරනවා. මේ දුක් පාත්‍රයෙන් බොන්න ජේසුට පැහැදිලිව ශුද්ධාත්මයාණන්ගේ ගින්න නැමැති බව්තිස්මය ලබන්න ඇති බව ප්‍රකාශ කරනවා. ජේසු දන්නවා මේ සහයදායකයාණෝ ඔවුන්වහන්සේ තුළ ඉඳගෙන දේව තාත්තාගේ කැමැත්තට කීකරු වෙන්න කොච්චර උදව් වුණාද කියලා. ජේසුගේ දූත කාර්යයට පමණක් නොවේ, සේවකයෙක් වෙලා, වහලෙක් වෙලා සියලු දෙනාගේ පාප උදෙසා තමන්ගේ ජීවිතය පූජාවක් වන්නට ලබපු සුවිශේෂ ආලේපයක් තමයි උන්වහන්සෙගේ බව්තීස්ම ස්නාපනය.

ඔවුන්වහන්සේගේ ඔලීව කන්දේ යාච්ඤාව දෙස බලන විට (ශු. මතෙව් 26:36-46) මෙහි සඳහන් වෙනවා "ඔවුන්වහන්සේ ශෝක වන්නටත්, සන්තාප වන්නටත් පටන් ගත්සේක." දේව තාත්තාගේ කැමැත්ත කරන්න දැන් මේ ගින්න ඕනේ. මේ දුක් වේදනා නමැති පාත්‍රය, දිව්‍යමය විනිශ්චය ජේසුට දීලා ඉවරයි. ඇයි ඔවුන්වහන්සේ අපේ පාපය කරට අරගත්තා ජෝර්දාන් නදියේදී. එහෙම නම් දැන් ඔවුන්වහන්සේ ඒකෙ වන්දිය ගෙවන්න ඕනේ. ශු. මතෙව් 26:38-39... ඔවුන්වහන්සේ තුන් සැරයක් මුනින් වැටී යාච්ඤා කරනවා. තුන් සැරේම කියනවා: "අහෝ මාගේ පියාණෙනි, හැකි නම් මේ කුසලානය මා කෙරෙන් පහ කළ මැනව. ..." දෙවියන් වහන්සේගේ කැමැත්ත අපෙන් උදුරා ගන්න යක්ෂයා, ලෝකයා, මාංශයා නිරතුරු බලන් ඉන්නවා. අපි ශුද්ධාත්මයාණන්ගේ ගින්නට හසු වුනේ නැත්නම් අපි ඒ පරික්ෂාවට හසු වෙනවා. මේ අන්තිම භයංකාර පැයෙන් තාත්තාගේ කැමැත්තෙන් තමන්ව ඉවත් කරන්න යක්ෂයා පරික්ෂා කරන ආකාරය ස්වාමින් වහන්සේට පේනවා. ඔවුන්වහන්සේ දන්නවා එහෙම නම් ගෝලයන්ව කොච්චර පරික්ෂා කරයිද? ඒ නිසා ගෝලයන්ට කියනවා,පරික්ෂාවට වැටෙන්නේ නැතිව යාච්ඤා කරන්න කියලා. මාක් තුමා කියනවා, "ඔවුන් වහන්සේ අතිශයින් බියපත් වෙන්න පටන් ගත්තා කියලා; ශෝක වෙන්නට පටන් ගත්තා කියලා." ලූක් තුමා කියනවා, "ඔවුන් වහන්සේ දැඩි සිත් වේදනාවෙන් පෙළුණු සේක. ඉතා ඕනෑකමින් යාච්ඤා කළ සේක" කියලා. ඔවුන් වහන්සේගේ වේදනාව වැඩි වෙන්න වැඩි වෙන්න යාච්ඤා කළා. හරි පරස්පරයි ලෝකයේ මිනිස්සු. ගෝලයෝ ඔවුන්ගේ වේදනාව වැඩි වෙන්න වැඩි වෙන්න නිදා ගන්නවා. ජේසුගේ වේදනාව වැඩි වෙන්න වැඩි වෙන්න ජේසු යාච්ඤා කරනවා. හෙබ්‍රෙව් ලිපියේ කියනවා "ඔවුන් වහන්සේ බලවත් හැඬීමෙන් කඳුළු සැලීමෙන් යාච්ඤා ද කන්නලව්ද ඔප්පු කළ සේක. (හෙබ්‍රෙව් 5:7) කාටද? දෙවි පියාණන් වහන්සේටයි.

හෙබ්‍රෙව් කතුවරයා "ඇඬීම" "කඳුළු සැලීම" නමැති වචන දෙකක් භාවිතා කරනවා. ඇඬීම අභ්‍යන්තික මොරගැසීමක්, කඳුළු සැලීම අභ්‍යන්තරික බැරිබාවයේ අමාකමේ බාහිර ප්‍රකාශනයක්.

දෙවියන් වහන්සේගේ කැමැත්ත කිරීම අපගේ කැමැත්තට මරණයක්. දේව කැමැත්ත මුළු මිනිස් සංහතියේ ගැළවීමයි. එම ගැළවීම සඳහා ගොනෙකුගේ, එළුවකුගේ ලේ ප්‍රමාණවත් නොවේ. ඒ සඳහා දෙවියන් වහන්සේගේම ලෙය වැගිරීම අවශ්‍ය වුනා. එ කල යුත්තේ ක්‍රිස්තන් වහන්සේයි. ක්‍රිස්තුන් වහන්සේගේ මරණීය වේදනාවට වඩා දෙවි පියාණන් දකිනුයේ මුළු මිනිස් සංහතියේ වේදනාවයි. එයින් මනුෂ්‍ය සංහතිය ගලවා ගැනීමට නම් මේ මොහොතේ දෙවියන් වහන්සේ යාගික විය යුතුයි. ක්‍රිස්තුන් වහන්සේගේ මෙහෙවර එයයි. ක්‍රිස්තුන් වහන්සේ යනු මනුෂ්‍යයෙකු වූ දෙවියන් වහන්සේයි.

එම අභ්‍යන්තරය තේරුම් ගැනීමට බුද්ධි ගෝචර නොවී ශුද්ධාත්ම ගෝචර විය යුතුයි. ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩ වාසය කරන්නේ අපගේ මොලය තුළ නොව, අප තුළයි. (ශු.ජුවාම් 14:17) මෙම දිව්‍යමය ගින්නට අප තුළ ක්‍රියා කිරීමට අප ඉඩ දෙන තරමට ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ දෙස බලමින් දෙවියන් වහන්සේගේ වචනය සෙවීමට, කැමැත්තට කීකරු වීමට අපට හැකි වනු ඇත.

අත්දැකීමක් :

* විශාල හෘද රෝගයකට ලක් වූ මවක් දැඩිව රෝගයට පත් වෙද්දී වෛද්‍යවරුන්ගේ නිර්දේශය වූයේ ඇයව ශෛල්‍ය කර්මයකට ලක් කිරීමයි. ඒ සඳහා සියළු පහසුකම් ඇය සතුව ඇත. අවශ්‍ය මිළ මුදල් ද දරුවන් සූදානම් කරද්දී ඇයගේ අභ්‍යන්තරික පිපාසය මා මේ සඳහා යොමු වීමට පෙර දෙවියන් වහන්සේගේ වචනය සෙවිය යුතු බවයි. ඇය ඒ සඳහා මඟපෙන්වීමක් ලබා ගැනීමට යොමු වූවාය. වෛද්‍ය නිර්දේශයට අනුකූල වීම දේව කැමැත්ත බව ඇයට මඟපෙන්වූ මවගේ පිළිතුර විය. මෙහිදී අවධානය යොමු කළයුතු දේ නම් ඇයට දේව වචනය සෙවීමට තිබූ පිපාසයයි.

* ශුද්ධාත්ම රැලියෙන් පසුව එළඹුනු සඳුදා දිනයක එක්තරා ප්‍රදේශයක වගකීම් ගැනීමේ අය සඳහා රැස්වීමක් සංවිධානය කර තිබුණි. පසුගිය දිනවල ඇදහැලුනු ධාරානිපාත වර්ෂාව හා ගංවතුරට දරුණුව හසු වුනු එම ප්‍රදේශය තුළ මෙම රැස්වීම පැවැත්වීම සැබවින්

අභියෝගයක් විය. ඒ පිළිබඳ වගකිවයුතු අය වචනය සොයද්දී අවසන් තීරණය වූයේ කථා කරගත් පරිදි නියමිත දින රැස්වීම පැවැත්වීමයි. රැස්වීම කරා පැමිණෙන විට ගංවතුරට යට වී පැමිණීමදුෂ්කර වෙද්දී එක් වාහනයක පැමිණි පිරිසව එම රියදුරා අතරමග බස්වා ගිය අතර ඔවුන්ට බස් රථවලින් පැමිණීමට සිදු විය.තව පිරිසක් පැමිණි වාහනයේ සිටි සංඝයේ අය අතරම හැරී යාමට කථා බහ ඇති වෙද්දී ලැබුනු වචනය තුළ ඉදිරියටම යෑම අවසන් තීරණය විය. මේ සියළු සිදුවීම් සමග සියළු දෙනා රැස්වී රැස්වීම පැවැත්වූ අතර මේ වසර පුරා සෑම සිදුවීමකදීම වචනය සෙවීම පිළිබඳව ද, වචනය සොයා ගත් පසුව මොන දුෂ්කරතා, විපාකවලට මුහුණ දීමට සිදු වුවද අවසානය තෙක් අවනත වීම පිළිබඳව ද විශාල අවදිවීමක් ඇති වී ඇත.

04. බෙදා ගැනීම :

i ඔබ පෞද්ගලික ජීවිතය තුළ, පවුල් තුළ තීරණ වලදී වචනය සොයනාවාද?

ii "වචනය" සෙවීම ගැන ඔබට අත්දැකීමක් තිබෙනවා නම් බෙදා ගන්න.

iii මේ වසර පුරා "වචනය" සෙවීම සඳහා දේව කැමැත්ත ඉටු කිරීමට ගතයුතු පියවරවල් සාකච්ඡා කරන්න.

iv දිනපතා දේව වචනය කියවීම, සුදතුම් ගමන සඟරාව කියවීම පිළිබඳව අත්දැකීම් බෙදා ගන්න.

05. අවසානය :

මේ වසර පුරා දේව කැමැත්ත ඉටු කිරීමට ශුද්ධාත්ම ගින්න අවුළුවන්න කියා ස්නාපනයක් පතා එකිනෙකාට යාච්ඤා කරමු.

පුබුදු ගී අංක 113 "බාධක පීඩා ...."

*********************

අවධානය සඳහා :

* ජූනි මස 09 දා පෙ.ව.09.00 සිට 10දා දිවා ආහාරය දක්වා ඇතුලාන්ත සුව සම්මේලනය ශ්‍රී ප්‍රශංසාරාමයේදී පැවැත්වේ.